# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1894/15 - 2014 දෙසැම්බර් මස 23 වැනි අඟහරුවාදා - 2014.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ 2014 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

**නිවේදනයයි**

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මම බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව 2014.11.05 දින ලැබී ඇති හෙයින්, එම ප්‍රඥප්තිය 2014.11.05 දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ<br>
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,<br>
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,<br>
ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ පිළිබඳ අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 17 වන දින.<br>
කොළඹ 07,<br>
ශ්‍රාවස්ති මන්දිරය,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දීය,

***බස්නාහිර පළාතේ 2014 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය***

*2010 අංක 02 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

කුඩා නාමය සහ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2014 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමත ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

02. ප්‍රධාන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය වෙනුවට පහත දැක්වෙන දීර්ඝනාමය ඇතුළත්කර සංශෝධනය කරනු ලැබේ :-

මේ ප්‍රඥප්තිය, සංශෝධිත වූ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත, සංශෝධිත පරිදි වූ 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත, සංශෝධිත පරිදි වූ සුරාබදු ආඥා පනත, සංශෝධිත පරිදි වූ 1957 අංක 37 දරන තෑගි තරග පනත, සංශෝධිත පරිදි වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත, සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥා පනත, සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යන පනත්හි ඇතැම් විධිවිධාන අනනුකූලව වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ XXIX පරිච්ඡේදය සඳහා නව වගන්ති ආදේශ කිරීම

03. මෙහි පහත දැක්වෙන පරිච්ඡේද අංකය, පරිච්ඡේද නාමය සහ වගන්ති පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වගන්තියට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර ඒවා XXIX අ වන පරිච්ඡේදය, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු 97 අ සහ 97 ආ වගන්ති ලෙස බලපවත්වන්නේ ය.

**XXIX අ වන පරිච්ඡේදය**

***ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු***

ජාතිය ගොඩනැගීමේ බද්ද පළාත් සභා අරමුදලට බැරකළ යුතු බව

97 අ 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනතේ 10 වගන්තියේ විධිවිධාන පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, ජාතිය ගොඩනැගීමේ බද්ද ලෙස එකතු කරන ලද මුළු මුදලින් සියයට තිස්තුනයි තුනෙන් එකක මුදලින් අයවැය අවශ්‍යතාවයන් සළකා මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් දැනුම් දෙන පරිදි නියමිත ප්‍රතිශතය බස්නාහිර පළාත් සභා අරමුදලට බැරකළ යුතුය.

මධ්‍යම රජයේ මුද්දර ගාස්තු පළාත් සභා අරමුදලට බැරකළ යුතු බව

97 ආ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, 2011 අංක 13 දරන පළාත් සභා මුද්දර ගාස්තු මාරුකිරීමේ පනතේ දෙවෙනි වගන්තියේ විධිවිධාන පරිදි 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව, ආණ්ඩුව විසින් මුද්දර ගාස්තු වශයෙන් එකතු කර ගන්නා ලද සියළු ආදායම්, එම ආදායම එකතු කරගනු ලැබූ පදනම මත බස්නාහිර පළාත් සභා අරමුදලට බැර කළ යුතුය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

04. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

01 - 270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.